**Cambridge Assessment International Education**
Cambridge Ordinary Level

**SINHALA** **3205/02**

Paper 2 Translation and Reading Comprehension **May/June 2019**

**1 hour 30 minutes**

INSERT

*2122906440-I*

**READ THESE INSTRUCTIONS FIRST**

This Insert contains the reading passage for use with the Question Paper.

You may annotate this Insert and use the blank spaces for planning.
This Insert is **not** assessed by the Examiner.

This document consists of **3** printed pages and **1** blank page.

KI 172989/1
© UCLES 2019

Read the following passage carefully and then answer, briefly and in **Sinhala**, **Questions 3–13** on the Question Paper.

අනිල් හැමවිට ම චීන සංස්කෘතිය කෙරෙහි ඉමහත් ඇල්මකින් සිටියේය. ඒ නිසා ඔහු තමාගේ චීන මිතුරා ඔහුගේ උපන් නගරය වූ කුන්මිං බලන්නට එන ලෙස කර තිබූ ආරාධනය පිළිගන්නට තීරණය කළේය. කුන්මිං චීනයේ නිරිත දිග යුනාන් පළාතේ ප්‍රධාන නගරයයි. එය 'සදාකාලික වසන්ත නගරය' යන නමින් ද ප්‍රසිද්ධය. අනිල් එය මෙසේ විස්තර කරයිඃ මේ නම ඇති වී තිබෙන්නේ එහි හැමදාම මෙන් පවත්නා වසන්ත සමයට සමාන කාලගුණය නිසායි. එය ශාකවලට හා මල් වලට සුදුසු ම දෙශගුණික තත්වයක් ලබාදෙයි.'

අනිල් තව දුරටත් විස්තර කරයිඃ 'බසයෙන්, බයිසිකලයෙන් හා පයින් ගමන් කිරිම හොඳ ම පිළිවෙල බව මා තීරණය කළේ එ මගින් මේ රමණීය පළාතේ නියම සුන්දරත්වය විඳගත හැකි වන බැවිනි. මෙහි දේශීය ජනයා අඳින කඳුකර ගෝත්‍රික ඇඳුම්, ඇඟට හිරවන චීන උඩුකබාය හා බටහිර ඇඳුම් විලාසිතා ද නිසා මේ නගරයට විශේෂ ආකර්ෂණයක් ඇතිවෙයි. එ බැවින් හරියට එය 'එක් පයක් අතීතයේත් අනික් පය අනාගතයේත්' තබා ගෙන සිටින්නාක් බඳු හැඟීමක් ඇතිවෙයි. ඒ හැඟීම අශ්වකරත්තයෙන් ගල් අඟුරු විකිණීමේ සිට පදික වේදිකාවල පරිගණක උපකාරක පන්ති පැවැත්වීම දක්වා වූ මෙහි ජනයාගේ ඇතැම් දෛනික කටයුතු නිසා වඩාත් තියුණු වෙයි.

මේ නගරයේ මගේ සිත වඩාත් ඇදගත් තැනක් වූයේ හරිත විල උද්‍යානයයි. උදෑසන හතේ සිට එය බාල තරුණ මහලු හැම වයසක ම ජනයාගෙන් පිරීයන්නේ හැමදින ම ඔවුන් තායි චී අභ්‍යාස කිරීමට එහි රැස් වන බැවිනි. කෙමෙන් දහවල් වන විට තරුණ පිරිස විලේ ඔරු පැදීමට පටන් ගන්නා අතර මහලු ගැහැණු මිනිස්සු විල් ජලය අයිනේ බංකුවල හිඳ ගෙන මායොං නම් ක්‍රීඩාව කරති. උද්‍යානයෙන් පිටත පලතුරු වෙළෙන්දෝ වෙති. ඔවුන් විකුණන අන්නාසි කොතරම් රසවත් ද යත් ඒ මුලු ජීවිතයට ම කන්නට ලැබෙන ඉතාමත් ම රසවත් පලතුරු බව හැඟෙයි.

ඉර බැස යන විට උද්‍යානය වසනු ලබන නමුත් ඉන් පිටත රාත්‍රියේ නැරඹීමට යා හැකි වෙනත් බොහෝ තැන් ඇත. රාත්‍රි කාලයේ කළ හැකි දේවල් ද දැන් වැඩි වන්නේ එහි ජනයා ඉක්මනින් ධනවත් වන හෙයිනි. අවන්හල් විවෘත වෙයි. ඇත්ත වශයෙන් ම සංචාරකයෝ රාත්‍රි ආහාර ගනිමින් චීන ජන සංගීතය අසමින් විනෝද වීමට මහත් කැමැත්තක් දක්වති.

'මම එක් දිනෙක රෑ නගරයෙන් පිටත ගමේ ඇවිදින්නට ගියෙමි. ඒ ගමේ පදිංචි ගෝත්‍රික ජනයා තමන්ගේ සාම්ප්‍රදායික නැටුම් පවත්වමින් සංචාරකයින් පිනවති. ඔවුහු සිනා මුසු මුහුණින් ඉත උණුසුම් ලෙස අප පිළිගත්හ.

කුන්මිං නගරයට පිටත උපනගරයේ සිට බටහිර කඳු පටන් ගැනේ. මම එහි නැග යමින් සිටිය දී පන්සල් දෙකක් පසුකර ගියෙමි. මා ඒවා තුළට නොගිය මුත් මගේ අරමුණ වූ ඉතා ප්‍රසිද්ධ ගලින් නිමවූ 'මකර තොරණ' සොයා යද්දි ඒ පන්සල්වල අලංකාර උයන්වල ඇවිදිමින් පැය ගණන් ගත කළෙමි.

© UCLES 2019

මකරතොරණ ඉතාමත් විස්මය ජනක ඉතා සුන්දර නිර්මාණයකි. මා එහි සිටි අවසාන දිනයේ උණ (ගස්) වනය බලන්නට ගියෙමි. එහි ඇත්තේ නිහඬ පූජනීය වටපිටාවකි. මා ඊට කැමති වුවත් කිසිවෙක් ඒ ගැන මැසිවිලි නගනු ද මට ඇසුණි. ඔහු කීවේ ඇතුළු වන දොරටුව අසළ කාමර පිළිමවලින් පිරී තදබදයක් පවතින බව හා දැඩි සුවඳ දුමාරය නිසා හුස්ම ගැනීම පවා අපහසු වූ බවත්ය.

කුන්මිංහි ගෙවූ දවස් කීපය ගැන මා ඉතාමත් සතුටු වන අතර එය නැරඹීට යාමට සුදුසු තැනක් ලෙස සහතික කිරීමටත් මම කැමැත්තෙමි. නැවත චීනයට යාමට ලැබෙන දිනය උදාවන තුරු මට ඉවසිල්ලක් නැත. මගේ ඊළග සිහිනය වන්නේ බීජිං බලන්නට යාමයි.

© UCLES 2019

BLANK PAGE

Permission to reproduce items where third-party owned material protected by copyright is included has been sought and cleared where possible. Every reasonable effort has been made by the publisher (UCLES) to trace copyright holders, but if any items requiring clearance have unwittingly been included, the publisher will be pleased to make amends at the earliest possible opportunity.

To avoid the issue of disclosure of answer-related information to candidates, all copyright acknowledgements are reproduced online in the Cambridge Assessment International Education Copyright Acknowledgements Booklet. This is produced for each series of examinations and is freely available to download at www.cambridgeinternational.org after the live examination series.

Cambridge Assessment International Education is part of the Cambridge Assessment Group. Cambridge Assessment is the brand name of the University of Cambridge Local Examinations Syndicate (UCLES), which itself is a department of the University of Cambridge.

© UCLES 2019